# විසංයෝජනයේ විසංවාදය හෙවත් පනුවන්ගේ දීනත්වය

මේ ලිපි පෙළේ අරමුණ නැවත නැවත මතක්කරදීම අවශ්‍ය වන්නේ එහි විවිධ දේ සාකච්ඡා කරණ බැවින් ඇතැමුන්ට අරමුණ අමතක වීමට ඉඩ ඇති බැවිනි. අපට අවශ්‍ය වන්නේ අපේ ප්‍රවාද නිර්මාණය කිරීම ය. ප්‍රවාද නිර්මාණය කරන්නේ පුද්ගලයන් බැවින් එහි අරමුණ ප්‍රවාද නිර්මාණය කිරීමට හැකි අය බිහිකර ගැනීම ය. ප්‍රවාද නිර්මාණය කිරීම සඳහා දැනට පිළිගෙන ඇති ප්‍රවාදවලට හා ඒ ප්‍රවාද නිර්මාණය කළවුන්ට අභියෝග කිරීමට සිදුවෙයි. අපට අවශ්‍ය අපේ විද්‍යාවක්, භෞතික විද්‍යාවක සිට සමාජ විද්‍යාවක් දක්වා වූ විද්‍යාවක්, දර්ශනයක්, සාහිත්‍ය විචාරයක්, කලා විචාරයක් ඇතුළු සමස්ත දැනුම් පද්ධතියක් නිර්මාණය කිරීම බැවින් අපේ සිසුනට ඒ ඒ ක්ෂෙත්‍රවල දැනුම්වලට හා දැනුම් නිර්මාණය කළවුන්ට අභියෝග කිරීමට සිදුවනු ඇත. ඒ සඳහා ඔවුන් හුරු කිරීම ද මේ ලිපි පෙළේ අරමුණට ඇතුළත් වෙයි. ඒ අතර මේ ලිපි පෙළෙහි අළුත් දැනුම ද නිර්මාණය කෙරී ඉදිරිපත් කෙරෙයි. එමෙන් ම බටහිර දැනුම අපට අවශ්‍ය ආකාරයට අවශෝෂණය කෙරෙයි. ඒ කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳ ව නිදර්ශන සැපයීම සඳහාත් ය. කිසිම විෂයයක අවසාන වාක්‍යය කියැවී නැති නිසා පමණක් නොව අප බටහිර දැනුමට බාහිර වූ දැනුමක් නිර්මාණය කරන බැවින් ද බටහිර පඬිවරුන් අතින් නිර්මාණය වී ඇති දැනුමට අප අභියෝග කළ යුතු ය.

සොසූර් යනු බටහිර වාග් විද්‍යාවේ තරමක් පෙරළියක් කළ තැනැත්තෙකි. ඔහු පමණක් නොව මෑත කාලයෙහි බටහිර සමාජීය විද්‍යවන්හි හා මානව ශාස්ත්‍රවල පෙරළි කිරීමට තැත් කළෝ මූලික වශයෙන් ගත්කල සාපේක්ෂතාවාදීහු වූහ. මේ සාපේක්ෂතාවදීහු බටහිර භෞතික විද්‍යාවෙන්, විශේෂයෙන් ම අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදයෙන් හා ක්වොන්ටම් භෞතික විද්‍යාවෙන් ආභාසය ලැබූහ. එහෙත් බටහිර සාපේක්ෂතාවාද කිසි දිනෙක නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයක් නොවී ය. එයට හේතුව වූයේ ථෙරවාද බුදුදහම වැනි ආත්මවාදී නොවන, අනිත්‍ය වූ සංස්කරණ (සබ්බෙ සංඛාරා අනිච්චා) ගැන කතාකරන දහමක ආභාසය ඔවුන්ට නොලැබීම ය. මේ හේතුවෙන් බටහිර සාපේක්ෂතාවාද අවසානයේ දී දුර්වල, ඊනියා යථාර්ථය හමුවේ කඩා වැටෙන, සාපේක්ෂතාවාද වෙයි. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනු සිංහල ථෙරවාද බුද්ධාගම ඇසුරෙන් අප විසින් නිර්මාණය කරන ලද දර්ශනයකි.

අද බටහිර ක්වොන්ටම් භෞතිකය ක්‍රමයෙන් නැවතත් ඊනියා යථාර්ථවාදයක් කරා ආපසු යයි. ඒ සමග එය පසුපස යන බටහිර සමාජීය විද්‍යාවන්ට හා මානව ශාස්ත්‍රවලට සාපේක්ෂතාවාදය අත් හැරීමට සිදුවෙයි. කෙසේ වෙතත් සොසූර් හෝ බෝර් හෝ බටහිර යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් මිදුණේ නොවේ. අපි සොසූර්ගේ පමණක් නොව බොර්ගේත් ස්රුඩිංගර්ගේත් අයින්ස්ටයින්ගේත් දුර්වලතා දකින්නෙමු. ඒ දුර්වලකම් හඳුනාගැනීමට අපි සිසුන් පුහුණු කරමු. ඉතා පැහැදිලිව ම අපි බටහිර විශ්වවේදයේ (Cosmology) මහා පිපිරුම (Big Bang) ප්‍රතික්ෂෙප කරන්නෙමු. ඒ වෙනුවට වෙනත් ප්‍රවාදයක් ඉදිරිපත් කිරීමට හැකි දැයි සොයා බැලීමට අපි දැන් කැළණිය විශ්ව විද්‍යාලයෙහි පර්යේෂණ කරන්නෙමු. සොසූර් වැන්නන් ඉදිරිපත්කර ඇති ප්‍රවාද අපට නම් කුඩාවුන්ගේ සෙල්ලම් වැනි ය. ද්විකෝටික න්‍යාය මත පදනම් වූ සංස්කෘතියක භාෂාව ගැන එතරම් ගැඹුරු ප්‍රවාද ඉදිරිපත්කිරීම සඳහා විභවයක් නැත. භාෂාවේ සීමාකම් ගැන අපේ සංස්කෘතියේ කතා කෙරෙන්නේ අවුරුදු දෙදහස් ගණනක සිට ය. භාෂාව හා මිනිසුන් අතර ඇත්තේ චක්‍රීය සම්බන්ධයකි. මිනිසුන් භාෂාවේ වචන, යෙදුම් ආදිය අනුව කටයුතු කරන අතර භාෂාව ද මිනිසුන් අතින් නිර්මාණය වෙයි. බටහිරයෝ කිසි දිනෙක මේ චක්‍රීය සම්බන්ධය නොසලකති. ඒක රේඛීය චින්තනයක් මත පදනම්වන ඔවුහු මිනිසුන් භාෂාවේ නිර්මිත ලෙස පමණක් සලකති.

ජීවිතයේ කිසිම දිනක නව ප්‍රවාදයක් නිර්මාණය කිරීමේ හැකියාවක් නැත්තාවූ ද, ඉංගිරිසි, සිංහල භාෂා ගැන හෝ ඊනියා පශ්චාත්නූතනවාදය ගැන හෝ එතරම් දැනුමක් නැත්තාවූ ද අනුකාරකයන්ට (ඉංගිරිසි සෑහෙන ප්‍රමාණයකට නොදැන ඩෙරීඩා වැන්නන්ගේ කෘතිවල ඉංගිරිසි පරිවර්තන කියවා අවබෝධ කර ගන්නේ කෙසේ ද?) කුඩා ළමුන්ගේ සෙල්ලම් වැනි මේ ඇතැම් ප්‍රවාද මහෝෂයක් ලෙස පෙනී ගිය ද සිංහල ථෙරවාද බුද්ධාගමේ ශක්තියෙන් පදම් වී ඇති අපට ක්වොන්ටම් භෞතික විද්‍යාවේ ද දුර්වලතා දැකිය හැකි ය. ක්වොන්ටම් භෞතික විද්‍යාව නැවතත් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් ව ආපසු ඊනියා යථාර්ථය කරා යන මෙකල බටහිර සාපේක්ෂතාවාදී මානව ශාස්ත්‍රවලට තිබූ වැදගත්කම නැතිවෙමින් පවතියි. සමස්තයක් ලෙස ගත්කල

© Prof. Nalin De Silva

පශ්චාත්නූතනවාදය යනු ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ඇති වූ ඉලෙක්ට්‍රොනික විප්ලවය තේරුම් ගත නොහැකි වූ බටහිර සමාජයීය විද්‍යාඥයන් ක්වොන්ටම් භෞතික විද්‍යාවේ ආභාසය ලබමින් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් කැඩීමට ගත් ඉතාමත් අසාර්ථක උත්සාහයක් පමණකි. ක්වොන්ටම් භෞතික විද්‍යාවේ ආපසු ගමනත් සමග මේ කසිකබල් පශ්චාත්නූතනවාදයට අද යන එන මං ද නැති වී ඇත. එහෙත් ඔවුන්ට, එනම් බටහිර පශ්චාත්නූතනවාදීන්ට ඒ බව තේරුම් ගැනීමට තව අවුරුදු ගණනාවක් ගතවනු ඇත. මෙරට සිටින අනුකාරක දීනයන්ට කළ හැක්කේ බටහිරයන්ගේ මතවාද වමාරා කෑම පමණකි.

අපි එකක් මතක තබාගත යුතු වෙමු. බටහිර සමාජයීය විද්‍යාවන්ට අද සමාජයේ තැනක් ලැබී ඇත්තේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදය හා බටහිර ස්වාභාවික විද්‍යාවන් හේතුකොටගෙන මිස ඒ විෂයන්හි වැදගත් යමක් ප්‍රකාශ කෙරෙන බැවින් නොවේ. බටහිර ඊනියා දේශපාලන විද්‍යාව ඉගෙන නොගත්තාට දේශපාලනයෙහි යෙදීමට හැකි ය. බටහිර දේශපාලන විද්‍යාව ඉගෙන ගැනීමට වඩා ඉගෙන නොගැනීම දේශපාලනයෙහි යෙදීමට උපකාර වන බව ද පැහැදිලි ය. එහෙත් බටහිර වෛද්‍ය විද්‍යාව ඉගෙන නොගෙන බටහිර වෙදකම කළ හැකි නොවේ. විද්‍යුත් පරිපථයකට හානියක් සිදුවුවහොත් එයට හේතුව සොයා පිළියමක් යෙදීමට බටහිර ඉංජිනේරුවරයකුට හෝ භෞතික විද්‍යාඥයකුට හෝ හැකි වෙයි. එහෙත් සමාජයේ ඇති නොයෙකුත් ප්‍රශ්නවලට පිළියම් යෙදිය හැකි බටහිර සමාජ විද්‍යාඥයෝ වෙත් ද? දේශපාලනඥයන් නිසා එය කළ නොහැකි බව යමකු කියන්නේ නම් අපට එය පිළිගැනීමට නොහැකි ය. හරිහමන් සමාජ විද්‍යාවක දේශපාලකයන්ගේ මැදිහත්වීම ද සාධකයක් විය යුතු ය. අනෙක් අතට දේශපාලනඥයන් මත පමණක් වරද පටවා තම ප්‍රවාදය ගලවා ගන්නා විද්‍යාවක් ගැන අපට කිසිම විශ්වාසයක් නැත.

බටහිර ස්වාභාවික විද්‍යා ලබා ඇති ජයග්‍රහණවල රශ්මියෙන් බටහිර සමාජයීය විද්‍යා බැබළීමට උත්සාහ දරණු පෙනෙයි. කෙසේ වෙතත් බටහිර සමාජයීය විද්‍යාඥයන්ගේ බොරු තකතීරු ප්‍රවාදවලට තැන ලබා දීමට බටහිර සංස්කෘතික යටත්විජිතවාදය ක්‍රියාකරයි. සංස්කෘතික යටත්විජිතවාදය හේතුකොටගෙන බටහිර සමජයීය විද්‍යාඥයෝ තම ක්ෂෙත්‍ර පිරිවසා ආධිපත්‍යය පතුරුවති. අපි නිසැකයෙන් ම මේ ආධිපත්‍යයට අභියෝග කර එය පරාජය කරමු. අපේ ප්‍රවාද ලිපි පෙළෙන් ඒ සඳහා අපේ සිසුහු පුහුණු කෙරෙති. මේ සිසුන්ට බටහිරයන්ට අභියෝග කර ඔවුන් පරාජය කිරීම අසීරු කටයුත්තක් නොවනු ඇත. එහෙත් දීන අනුකාරකයන්ට එසේ නොවේ. ඔවුන්ගේ පළමු ප්‍රශ්නයක් වනුයේ බටහිරයන්ට අභියෝග කිරීමට අප කවු ද යන්න ය. ඔවුහු තම ස්වාමීන් වූ බටහිර ඊනියා උගතුන්ට එරෙහිව කිසිවක් නොකියනවා පමණක් නොව, තම ස්වාමීන්ට අභියෝග කිරීමට තරම් හැකියාවක් මෙරට කිසිවකුට නැතැයි සිතති. මෙරට සිටින අනුකාරක දීන පශ්චාත්නූතනවාදීහු තම ස්වාමීන් අභියෝගයට ලක්කල නොහැකි කොටසක් ලෙස සලකා තම දීනත්වය ප්‍රකාශ කරති.

පශ්චාත්නූතනවාදයේ කියැවෙන ඊනියා විසංයෝජනය (deconstruction) තරම් ළාමක දෙයක් තවත් නැත. මෙය මහා දෙයක් ලෙස බටහිරයන්ට පෙනී ගිය ද (බටහිර දර්ශන ඉතාමත් නොගැඹුරු බව අමතක නොකළ යුතු ය.) වෙනත් බටහිර දර්ශනවාදවල මෙන් ම මෙහි ද ඇත්තේ වචන ටිකක් පමණ ය. විසංයෝජනය අවසාන වශයෙන් ගත්කල පශ්චාත්නූතනවාදයේ බංකොළොත්බව පෙන්වන්නා වූ මතවාදයකි. එහි පදනමේ ඇත්තේ මිනිසා භාෂා නිර්මිතයක් ය යන්න ය. මිනිසා ක්‍රියා කරන්නේ භාෂාවේ ඇති වචන යෙදුම් ආදිය විසින් කෙරෙන මෙහෙයුමක ප්‍රතිඵලයක් ලෙස යැයි පශ්චාත්නූතනවාදීහු කියා සිටිති. බටහිර සංස්කෘතිය සුදු කළු වැනි ද්විමය විරුද්ධයන් (binary oppositions) මත පදනම් වන බවත් පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය එහි කේන්ද්‍රීය අංගය බවත් පවසන ඔවුහු භාෂාවේ යෙදුම් තුළ සුදු කළු වැනි ද්විමය විරුද්ධයන්ගෙන් එක් අර්ධයකට අනෙක් අර්ධය අභිබවා යන වැදගත් කමක්, බලයක් ලබා දෙන බවත් පවසා මේ වැදගත්කම හා බලය හෙළිදරවු කිරීම සඳහා භාෂා යෙදුම් විශ්ලේෂණය කරති. එසේ භාෂාව විශ්ලේෂණය කිරීමෙන් ඒ සැඟ වී ඇති බලාධිකාරය හෙළිදරවු කිරීම විසංයෝජකයන්ගේ ප්‍රධාන අරමුණ වෙයි. වඩා සාධාරණ ව (පොදුවේ - in general) ගතහොත් විසංයෝජනයෙන් යමක් ප්‍රකාශ කෙරෙන සන්දර්භය විශ්ලේෂණය කෙරෙයි.

මේ කියන්නේ මහා ලොකු දෙයක් නොවේ. බටහිර ඒක රේඛීය චින්තකයන්ට එය ගැඹුරු දෙයක් ලෙස පෙනී ගිය ද බුදුන් වහන්සේ දෙසූ විසංඛාර ගැන අවබෝධයක් ඇති සිංහල බෞද්ධයන්ට විසංයෝජනය යනු තුට්ටු දෙකේ වැඩකි. හිටපු කතෝලික පූජකවරු වැනි බුද්ධාගම ගැන බෞද්ධයන්ට උගන්වීමට කැසකවන ඇතැමුන් විසංඛාර යනු

© Prof. Nalin De Silva

විසංයෝජනය යැයි පෙන්වීමට තැත්කළ ද එය එසේ නොවේ. විසංයෝජනය ද සංඛාරයකි. එය ද මිනිසුන්ගේ නිර්මාණයකි. එබැවින් එයට විසංඛාර යැයි කිව නොහැකි ය. භාෂාවක් කතා කරන විට අපි අවිඥානික ව බොහෝ දෑ උපකල්පනය කරමු. විසංයෝජනයෙන් කෙරෙන්නේ ඉන් කොටසක් හෙළිදරවු කිරීම පමණකි. අප යමක් හොඳ යැයි කියන විට එසේ කියන්නේ යම් පදනමක සිට හොඳ යන්න ගැන පූර්ව විනිශ්චයක් ඇතිව ය. අපේ සංස්කෘතියෙහි හොඳ නිවනට සාපේක්ෂව තීරණය වෙයි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හොඳ තීරණය වන්නේ අවසාන විග්‍රහයෙහි දී යෙහෝවා දෙවියන් වහන්සේ මත පදනම් ව ය. මෙහි අප නොදන්නා දෙයක් වේ ද? විසංයෝජනය ද ඇතුළු සියල්ල අප විසින් යම් පසුබිමක සංස්කරණය කෙරෙන දෑ ය. එනම් නිර්මාණය කෙරෙන දෑ ය.

විසංයෝජනයෙහි විසංවාදයක් වෙයි. ඒ ඒක රේඛීය වූ බටහිර ග්‍රීක ක්‍රිස්තියානි යුදෙව් චින්තනය තුළ ය. විසංයෝජකයන්ට අනුව මිනිසා භාෂා නිර්මිතයක් යැයි සැලකෙයි. මිනිසා භාෂා නිර්මිතයක් නම් මිනිසාට භාෂාව විශ්ලේෂණය කිරීමට හැකියාවක් ලැබෙන්නේ කෙසේ ද? භාෂාව විසින් මිනිසා හසුරුවනු ලබන්නේ නම් මිනිසාට භාෂාව විශ්ලේෂණය කර තම හැසිරීම් රටාව වෙනස් කර ගත නොහැකි ය. එහෙත් විසංයෝජකයන් කරන්නේ මුළු මහත් සමාජය ම එවැනි විශ්ලේෂණ හරහා වෙනස් කරවීමට ය. මෙය නම් තකතීරුම කතාවකි. ඊනියා විසංයෝජකයන්ට විසංයෝජනය විසංයෝජනය කර ගත නොහැකි ය. ඒ ඔවුන්ගේ ඒක රේඛීය චින්තනය හේතුවෙනි. විසංයෝජනය විසංයෝජනය කළ හැක්කේ චක්‍රීය චින්තනයක ය. මිනිසා හා භාෂාව අතර ඇති චක්‍රීය සම්බන්ධය බටහිර කසිකබල් දාර්ශනිකයන්ට විශ්ලේෂණය කර ගත නොහැකි ය. ඩෙරීඩාලා විට්ගන්ස්ටයින්ලා මහා දාර්ශනිකයන් වන්නේ සිංහල ථෙරවාදී බෞද්ධයන්ට නොව බටහිරයන්ට හා ඔවුන් අනුකරණය කරන්නන්ට ය.

ඊනියා විසංයෝජකයෝ  කිසි දිනෙක බටහිර දැනුම විසංයෝජනය නොකරති. එහි ඇති ඒකාධිකාරීබව, ආධිපත්‍යය, සංස්කෘතික යටත්විජිතවාදය සමග එය බැඳී ඇති ආකාරය, බටහිර දැනුම අප මත බලෙන් හා උපක්‍රමයෙන් පැටවීම, බටහිර දැනුමේ යුදෙව් ක්‍රිස්තියානි පදනම, බටහිර සංකල්ප යෙහෝවා දෙවියන් වහන්සේ සමග බැඳෙන අයුරු ආදිය කිසිවිටෙකත් විසංයෝජනය නොවේ. බටහිර දැනුම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට සාපේක්ෂ බව විසංයෝජකයන්ට හසු නොවේ. බටහිර විද්‍යාවේ  වාස්තවිකත්වය යනු බොරුවක් බව විසංයෝජකයෝ හෙළි නොකරති. කෙටියෙන් කිවහොත් යථාර්ථය, වාස්තවිකත්වය ආදිය යෙහෝවා දෙවියන් වහන්සේගෙන් ගලා එන දේ බව ඔවුහු නොකියති. ඒ වෙනුවට ඔවුහු බටහිර දැනුමේ ඊනියා වාස්තවිකත්වයත්, එහි ආධිපත්‍යයත් දණ්ඩ නමස්කාරයෙන් පිළිගනිති. දීනයන්ට රසයක් ඇත්තේ දීනත්වයේ ම පමණකි. පණුවා අශූචි සොයා යන්නාක් මෙන් පශ්චාත් නූතන වාදියා (පනුවා)  දීනත්වය සොයා යයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva